# දියමන්ති ව්‍යාපෘතිය

## පුරවැසි අධ්‍යාපනය - 9 ශ්‍රේණිය

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියෙහි අදහස, ඉලක්ක හා ක්‍රියාවලිය

'' නිපුණතා පාදක අධ්‍යාපනික ප්‍රවේශය" තුළින් වත්මන් ශ්‍රී ලාංකේය දරු පරපුර තුළ අර්ථවත් ඉගෙනුමක් මත පරිපූර්ණ ජීවිතයකට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, හුරුපුරුදු රෝපණය කොට ඒවා වර්ධනය කර ගැනීමට මඟපෙන්වීම් සිදු කර ඇත. පාසල් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ අපේක්ෂාව වනුයේ සක්‍රීය මෙන්ම ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් තුළ අත්දැකීම් ලබා ගැනීමට මඟපෙන්වීමත් ඒ මඟින් නිපුණතා පූර්ණ සමබර පෞරුෂයක් ඇති පුද්ගලයෙකු සමාජයට හිමිකර දීමත්‍ය. එහි අවසන් ඵලය වන්නේ අධ්‍යාපන ක්ෂෙත්‍රයට යොදවන යෙදවුම් ප්‍රමාණයට සාපේක්ෂව, ඵලදායි නිමැවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන්, ගෝලීය ප්‍රවණතාවයට සරිලන පරපුරක් බිහි කිරීමත්‍ය.

එබැවින් සෑම පාසලක ම, සෑම ගුරුභවතෙකු විසින් ම සෑම දරුවෙකුට ම සමාන ඉලක්ක සහිතව ඉගැන්වීම, පාඩම් සැලසුම් කිරීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ක්‍රියාකාරීව නිරත කරවීම, පන්ති කාමර ඇගයීම් හා තක්සේරුකරණය ඵලදායී ලෙෂ යොදා ගැනීම හා කාලය සඵලදායි ලෙෂ කලමනාකරණය කර ගැනීමට අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් ''දියමන්ති ව්‍යාපෘතිය" හඳුන්වා දී ඇත.

සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් හා ගුණාත්මක යෙදවුම් තෝරා ගැනීමට ගුරුභවතුන්ට අත්‍යවශ්‍ය මඟපෙන්වීම පමණක් මෙමගින් ලබා දී තිබේ. ගුරුවරයා තම නිර්මාණාත්මක හැකියාව මත විධිමත්ව ඉලක්ක වෙත ළඟාවිය යුතුය. මෙමගින් නව ලොවට උචිත නිපුණතා පූර්ණ පුරවැසියන් බිහි කිරීම හා එයට ගැලපෙන ගුරු භූමිකාවක් හා ක්‍රියාශීලී පන්ති කාමරයක් සහිත ඉගෙනුම් සංස්කෘතියක් නිදහස් අධ්‍යාපනයට දායාද කිරීම අපගේ අපේක්ෂාවයි.

එස්. කුරුප්පු ආරච්චි
සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

# දියමන්ති ව්‍යාපෘතියෙහි ප්‍රයෝජන

❖ **මෙම ලේඛන භාවිතා කොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියළුම කණ්ඩායම් මතු සඳහන් උපදෙස් පරිදි කටයුතු කර දරුවන්ට ඉගෙනුම් අවස්ථා වැඩි වශයෙන් ලබා දීමට ක්‍රියා කළ යුතුය.**

1. ගුරුභවතුන් විසින් සෑම ඒකකයක්ම නියමිත කාල වකවානු තුළ නිම කිරීම.
2. ඊට අදාල ඉලක්ක, පැවරුම් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා ඇගයීම් ලබා දීම.
3. මෙම ඉලක්ක පිළිබඳව දරුවන්, දෙමව්පියන් ආදී සියලුම පාර්ශව දැනුවත් කිරීම. ( ටියුෂන් ගුරුවරු ද මෙම ඉලක්ක අනුගමනය කිරීම ඵලදායි වේ.)
4. පළාතේ සියලුම ඇගයීම් හා වාර පරීක්ෂණ මෙම ඉලක්ක මත ප්‍රමිතිගතව නිර්මාණය කිරීම.
5. විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, අංශ ප්‍රධාන, විෂය ප්‍රධාන යන අභ්‍යන්තර අධීක්ෂණ කණ්ඩායම් ද, ගුරු උපදේශක, විෂය අධ්‍යක්ෂවරු ආදී සියළුම බාහිර අධීක්ෂක කණ්ඩායම් ද මෙම ඉලක්ක අනුව කටයුතු කිරීම.
6. සියලුම අධීක්ෂණ වර්තා මඟින් මෙම ඉලක්ක ළඟාකර ගෙන ඇති ප්‍රමාණය සහ එහි ගුණාත්මක තත්ත්වයන් තක්සේරු කිරීම.
7. ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ කාර්ය සාධනය මැනීමේ දී මෙම ඇගයීම් වාර්තා මත කටයුතු කිරීම.

❖ තම විෂයයට අදාල කාලය කළමනාකරණය කර ගැනීම සඳහා ගුරුවරයාට ද, විෂයයකට අදාලව උපරිම ඉගෙනුම් කාලයක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයාට ද අධීක්ෂණය හා නියාමනය සඳහා අභ්‍යන්තරව හා බාහිර අධීක්ෂකවරයාට ද, පාසල තුළ විෂය මාලාව නිසි ලෙස කළමනාකරණය පිණිස විදුහලිපතිවරයාට ද, ඇගයීම් ප්‍රමිතිගතව සංවිධානය සඳහා අදාල කණ්ඩායම් වලට ද, දරුවා යන ගමන් මඟ සහ පාසලේ ක්‍රියාවලිය නිසි ලෙස දැකීම දෙමව්පියන්ට ද, පාසලට හා දරුවාට සහාය දීම පිණිස විවිධ බාහිර පාර්ශවයන්ට ද, කළමනාකරණ තීරණ ගැනීම සඳහා කළමනාකරුවන් හා පරිපාලකයන්ට ද මූල්‍ය ප්‍රගතිය හා ඵලය මැනීම සඳහා විගණන නිලධාරයාට මෙම ලේඛනය අතිශය ඵලදායී වේ.

# සමාජයීය විද්‍යා විෂයන් දියමන්ති ව්‍යාපෘතියට . . .

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පළාතට අයිති ග්‍රාමීය නාගරික, ලොකු කුඩා, ජනප්‍රිය හා ජනප්‍රිය නොවන සෑම පාසලක් තුළම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියත්, අභ්‍යන්තර/ බාහිර අධීක්ෂණ ක්‍රියාවලියත්, සම්භවන/සම්පින්ඩිත ඇගයීම් ක්‍රියාවලියත්, නිෂ්චිත දින වකවානු, නිෂ්චිත ක්‍රමවේද හා නිෂ්චිත ප්‍රමිති සහිත ව ක්‍රියාත්මක කිරීම මගින් සෑම දරුවකු සඳහා ම සමාන ඉගෙනුම් අවස්ථා සම්පාදනයත්, අධ්‍යාපනයේ සම අවස්ථා සම්පාදනයත් ඉලක්ක කොටගෙන දියමන්ති ව්‍යාපෘති වැඩසටහන ක්‍රියාවට නැංවේ.

මේ අනුව පළාතේ සමාජ විද්‍යා ගුරු උපදේශකවරුන්ගේත්, විෂය ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ ගුරුභවතුන්ගේත් සම්පත්දායකත්වය ලබා ගෙන සකස් කරනු ලැබූ ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය විෂයයන්ට අයත් අධ්‍යයන ඉලක්ක, ආදර්ශ ඇගයීම් ආකෘති, ආදර්ශ ඉගෙනුම් ආධාරක ආදිය අනුගමනය කිරීම, සැලසුම් සහගත අධ්‍යයන ක්‍රියාවලියකට මග පාදයි. තවද ගුරුවරයාගේ කාලය මනා ලෙස කළමනාකරණයට මග පාදයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සෘණාත්මකව බලපෑමක් කරන, පාඩමට පූර්ව සූදානම සම්බන්ධව ඇතැම් ගුරුවරුන්ගේ තිබෙන ගැටළුත්, ඒකාකාරී ඉගෙනුම් ක්‍රමවේදයන් හේතුවෙන් බහුවිධ හැකියාවන්ගෙන් යුත් දරුවන්ට සිදුවන අවාසිදායක තත්ත්වයනුත් මෙතුළින් නිවැරදි කරගත හැකිය.

මෙහි දී විශේෂයෙන් ම අවධාරණය කළ යුතු කාරණාවක් වන්නේ දියමන්ති ව්‍යාපෘතිය දෙවන අදියර කොටසේ දී අප විසින් ඉදිරිපත් කරන ආකෘතිය ගුරුවරයාට කරන මග පෙන්වීමක් පමණක් වන අතර විෂය උගන්වන ගුරුවරයාගේ දැනුම අත්දැකීම් හා හැකියාවන් මත මෙම මගපෙන්වීම ඔස්සේ විෂය මාලාව නිර්මාණශීලීව සකස් කර ගත හැකිය. ආකෘතියකින් අප ඉදිරිපත් කරන ආදර්ශ ක්‍රමවේදයන්ට සීමා වීම අපේක්ෂා නොකෙරේ. සමාජීයය විද්‍යා විෂයයන්ට අදාළ ගුරු මාර්ගෝපදේශ සහ අනෙකුත් සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණශිලී ඉගෙනුම් අත්දැකීමක් වෙත සිසුන් යොමු කිරීමෙන් මෙහි ඇති ඉලක්ක වෙත වඩාත් සඵලදායි ලෙස ළඟාවීම ගුරුවරයා සතු වගකීම වේ.

ඒ අනුව මෙහි සඳහන් දින වකවානු අනුව ම, පාඩම් ඒකක අවසන් කර අදාළ ඇගයීම්වලට සිසුන් යොමු කිරීම අපේක්ෂා කරන අතර මෙය අප පළාතේ දරුවන් සමබර පෞරුෂයකින් යුක්ත ව සමාජයට දායාද කිරීමට ඔබ දක්වන මාහැඟි දායකත්වයට අත්වැලක් වනු ඇත.

ජේ. ඒ. ඩී. මාලින්ද
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යාව)
සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
## (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**9 ශ්‍රේණිය**

**පළමු වාරය** **පුරවැසි අධ්‍යාපනය**

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| **09** | 9.1 සමාජ සුරක්ෂිතතාව | 9.1.1 | සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන | | 04 | පැය 02 වි. 40 | |
| | | 9.1.2 | එම ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම | ජනවාරි 26 | 04 | පැය 02 වි. 40 | |
| | 9.2 කාලීන වෙනස්වීම් | 9.2.1 | කාලීන වෙනස්වීම් පුද්ගල හා සමාජ සංවර්ධනයට බලපාන ආකාරය | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.2.2 | ආර්ථිකයේ සිදුවන වෙනස්වීම් | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.2.3 | එකියා වෙළඳපොල හා බැඳුණු නව ප්‍රවනතා | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.2.4 | තරඟකාරී ලෝකයේ යහජීවනය ගුණාංග තුලින් සහජීවනයේ කටයුතු කිරීම. | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.2.5 | සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුත් පුරවැසියෙක් ලෙස කටයුතු කිරීම. | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.2.6 | දේශියත්වය රැකගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම. | මාර්තු 16 | 03 | පැය 01 වි. 20 | |
| **දෙවන වාරය** | | | | | | | |
| | 9.3 ප්‍රජාතන්ත්‍රවාදී පාලනය | 9.3.1 | ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික අංග ලක්ෂණ | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.3.2 | ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම් හා යුතුකම් | | 02 | පැය 01 වි. 20 | |

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | | 9.3.3 දේශපාලන පක්ෂ | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.3.4 මැතිවරණ හා ඡන්ද බලය | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.3.5 ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු ලෙස අවස්ථානෝචිතව ස්ථිර භාවයෙන් කටයුතු කිරීම | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.3.6 ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු ලෙස ජාතිය ගොඩනැඟීම සඳහා කැපවීම. | ජූනි 01 | 02 | පැය 01 වි. 20 | |
| | 9.4 පළාත් පාලන ආයතන | 9.4.1 පළාත් පාලන ආයතන වල ව්‍යුහය | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.4.2 පළාත් පාලන ආයතන වලින් සිදුවන සේවය | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.4.3 පළාත් පාලන ආයතන වල සේවා හා සම්බන්ධ මහජන යුතුකම් | | 01 | වි. 40 | |
| | | 9.4.4 පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂමව ඉටුකිරීමේ වැදගත්කම | | 01 | වි. 40 | |
| | | 9.4.5 පළාත් පාලන ආයතන මඟින් ජාතික සංවර්ධනයට ලබාදෙන දායකත්වය | ජූනි 13 | 02 | පැය 01 වි. 20 | |
| **තුන්වන වාරය** | | | | | | |
| | 9.5ගැටුම් නිරාකරණය | 9.5.1 ගැටුම් පිළිබඳ විශ්ලේෂණය කරයි. | සැප්. 28 | 02 | | |
| | | 9.5.2 ගැටුම් නිරාකරණය | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.5.3 ගැටුම් සුහවාදීව නිරාකරණය කිරීම | | 02 | පැය 01 වි. 20 | |
| | 9.6 වැඩ ලෝකය | 9.6.1 පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම. | | 01 | වි. 40 | |
| | | 9.6.2 විවිධ වෘත්තීන් / රැකියා | | 01 | වි. 40 | |
| | | 9.6.3 විවිධ රැකියා / වෘත්තීන් සඳහා පිවිසුම් ගවේෂණය කරයි. | නොවැ. 13 | 01 | වි. 40 | |

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | | 9.6.4 රැකියා/ වෘත්ති සඳහා අවශ්‍ය සුදුසුකම් හා පලපුරුද්ද | | 01 | වි. 40 | |
| | | 9.6.5 ඉතා උසස් ලෙස සැදසූ ජීව දත්ත පත්‍රිකාවක් තබා ගැනීම | | 02 | පැය 01 වි. 20 | |
| | | 9.6.6 රැකියා ඉල්ලුම්පත්‍රයක් නිවැරදිව සම්පූර්ණ කිරීම | | 01 | වි. 40 | |
| | | 9.6.7 රැකියා ඇබෑර්තුවක් සඳහා ලිපියක් සැකසීම | | 01 | වි. 40 | |
| | | 9.6.8 සම්මුඛ පරීක්ෂණ | | 01 | වි. 40 | |
| | | 9.6.9 සම්මුඛ පරීක්ෂණයකට හොඳින් මුහුණදීමේ වැදගත්කම | | 01 | වි. 40 | |
| | | 9.6.10 කාල කළමනාකරණය කරගැනීම | | 01 | වි. 40 | |
| | | 9.6.11 සැමවිටම හොඳින් හැසිරීමේ වැදගත්කම | | 01 | වි. 40 | |
| | | 9.6.12 නිවැරදිව පෞද්ගලික මූල්‍ය කළමනාකරණය | | 01 | වි. 40 | |
| | | 9.6.13 වෘත්තිය හා පෞද්ගලික ජීවිතය සමතුලිත ලෙස පවත්වාගැනීම. | නොවැ. 13 | 01 | වි. 40 | |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
## (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**
**9 ශ්‍රේණිය**

**පළමු වාරය - පුරවැසි අධ්‍යාපනය**

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 9.1.1 සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන | සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායකවන ආයතන ලැයිස්තු ගත කරයි. | ආගමික ආයතනය මගින් සමාජ සුරක්ෂිතතාව සඳහා කරනු ලබන කාර්‍යභාරය පිළිබඳව ගුවන් විදුලි සාකච්ඡාවක් සංවිධානය කරන්න. | දේශන ක්‍රම<br>සංවාද<br>පැවරුම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>සාකච්ඡා මණ්ඩල<br>බුද්ධි කලම්භනය<br>අන්තර්ජාලය | ගුවන්විදුලි සාකච්ඡා, රූපවාහිනී වැඩසටහන්, වීඩියෝ පට, පුවත්පත්, සඟරා, තාක්ෂණික උපකරණ | නඩු විභාගයක් නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රදේශයේ අධිකරණ ආයතනයකට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. | |
| 9.1.2 එම ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම | සමාජ සුරක්ෂිතතාව සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ගෙන ඇති විධිවිධාන පෙළ ගස්වන්න. | අධිකරණය, පොලිසිය හා ආරක්ෂක හමුදා මගින් සමාජ සුරක්ෂිතතාව ඇතිකරලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න. | දේශන ක්‍රම<br>සංවාද<br>පැවරුම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>සාකච්ඡා මණ්ඩල<br>බුද්ධි කලම්භනය<br>අන්තර්ජාලය | ගුවන්විදුලි සාකච්ඡා, රූපවාහිනී වැඩසටහන්, වීඩියෝ පට, පුවත්පත්, සඟරා, තාක්ෂණික උපකරණ | සමථ මණ්ඩලයක් මඟින් ගැටුම් නිරාකරණය කරන ආකාරය රඟ දක්වන්න. | |
| 9.2.1 කාලීන වෙනස්වීම් පුද්ගල හා සමාජ සංවර්ධනයට බලපාන ආකාරය | තාක්ෂණය භාවිතා කිරීමේ වැදගත්කම විස්තර කරන්න. | තාක්ෂණික වෙනස්වීම්, සමාජ වෙනස්වීම් වලට බලපාන ආකාරය පෙන්වීමට උදාහරණ දක්වන්න. | දේශන ක්‍රම<br>සංවාද<br>පැවරුම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>සාකච්ඡා මණ්ඩල<br>බුද්ධි කලම්භනය<br>අන්තර්ජාලය | ගුවන්විදුලි සාකච්ඡා, රූපවාහිනී වැඩසටහන්, වීඩියෝ පට, පුවත්පත්, සඟරා, තාක්ෂණික උපකරණ | ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක් නැරඹීමට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම.<br>නව තාක්ෂණය භාවිතයේ වාසි අවාසි සම්බන්ධ විවාදයක් සංවිධානය කිරීම. | |

| අනු ඒකකය | | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|
| 9.2.2 | ආර්ථිකයේ සිදුවන වෙනස්වීම් | පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ආර්ථිකයේ සිදුවන වෙනස්වීම් පෙළ ගස්සන්න.<br>කෘෂි අංශය, කාර්මික අංශය, සේවා අංශය | වර්ථමාන ආර්ථිකයේ කෘෂි හා කාර්මික අංශය අභිබවා සේවා අංශයේ රැකියා වැඩිවීමට බලපා ඇති හේතු වගු ගත කිරීම. | දේශන ක්‍රම<br>සංවාද<br>පැවරුම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>සාකච්ඡා මණ්ඩල<br>බුද්ධි කලම්භනය<br>අන්තර්ජාලය | ගුවන්විදුලි සාකච්ඡා,<br>රූපවාහිනී<br>වැඩසටහන්,<br>වීඩියෝ පට,<br>පුවත්පත්, සඟරා,<br>තාක්ෂණික<br>උපකරණ | තාක්ෂණය භාවිතා කරන ගොවිපලක් නැරඹීමට නිරීක්ෂණ චාරිකාවක් සංවිධානය කිරීම. | |
| 9.2.3 | රැකියා වෙළඳපොල හා බැඳුණු නව ප්‍රවනතා | නව ප්‍රවනතා (තාක්ෂණය) ඔස්සේ ඇති වී තිබෙන රැකියා ලැයිස්තුවක් සකස් කිරීම | නව රැකියා මං පෙත් විවර කරගැනීමට ඔබ විසින් සපුරා ගත යුතු සුදුසුකම් ඇතුළත් කර ජීව දත්ත පත්‍රිකාවක් සකස් කරන්න. | දේශන ක්‍රම<br>සංවාද<br>පැවරුම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>සාකච්ඡා මණ්ඩල<br>බුද්ධි කලම්භනය<br>අන්තර්ජාලය | ගුවන්විදුලි සාකච්ඡා,<br>රූපවාහිනී<br>වැඩසටහන්,<br>වීඩියෝ පට,<br>පුවත්පත්, සඟරා,<br>තාක්ෂණික<br>උපකරණ | සංවර්ධිත රටක තාක්ෂණය භාවිතා කරමින් සිදුකරන නව රැකියා වෙළඳපලක දර්ශන අඩංගු වීඩියෝ පටයක් නැරඹීම. | |
| 9.2.4 | තරඟකාරී ලෝකයේ යහජීවනය ගුණාංග තුලින් සහජීවනයේ කටයුතු කිරීම. | සමාජයේ පුරවැසියන් විසින් ප්‍රගුණ කළයුතු යහජීවන ගුණාංග මොනවාදැයි විස්තර කරමින් බෞද්ධ ශිෂ්‍ය සංගමයට කතාවක් ඉදිරිපත් කිරීම. | වර්ථමාන සමාජයේ යහජීවන බිඳවැටීමට බලපා ඇති හේතු පැහැදිලි කරමින් ඒවා අවම කරගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග විස්තර කරමින් රූපවාහිනී වැඩ සටහනක් මෙහෙයවීම. | දේශණ<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>කණ්ඩායම්<br>ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>බුද්ධි කලම්භනය<br>සම්මුඛ සාකච්ඡා<br>ප්‍රශ්නකරණය | වීඩියෝ දර්ශන<br>පුවත්පත්<br>තාක්ෂණික මෙවලම්<br>පෝස්ටර් / චිත්‍ර | වර්ථමාන සමාජයේ සහජීවනය තුළින් පුද්ගල හා සමාජ සංවර්ධනය සිදුවන ආකාරය විස්තර කරමින් පුවත්පතකට යැවීමට ලිපියක් සැකසීම. | |

| අනු ඒකකය | | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|
| 9.2.5 | සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වී සහජීවනයෙන් යුත් පුරවැසියෙක් ලෙස කටයුතු කිරීම. | සමූපකාර ව්‍යාපාරයේ ආරම්භය හා වර්ථමාන ක්‍රියාකාරිත්වය ගැන රචනයක් ලියන්න. | විවිධ සේවා සමූපකාර සමිති හා පාසල් සමූපකාර සමිති වල ප්‍රයෝජනවත්භාවය විස්තර කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න. | දේශණ<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>කේෂ්ත්‍ර චාරිකා<br>බුද්ධි කලම්භනය<br>සම්මුඛ සාකච්ඡා<br>ප්‍රශ්නකරණය | වීඩියෝ දර්ශන<br>පුවත්පත්<br>තාක්ෂණික මෙවලම්<br>පෝස්ටර් / චිත්‍ර | පාසල් සමූපකාර නොමැති පාසල්වල සමූපකාරයක් ආරම්භ කිරීම.<br>ආරම්භ කර ඇති පාසල් වල සමූපකාරය මගින් විධිමත් වෙළඳපලක් සංවිධානය කිරීම. | |
| 9.2.6 | දේශියත්වය රැකගනිමින් විශ්ව ගම්මානයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම. | “ගෝලීයකරණය සමාජයේ යහපතට මෙන්ම අයහපතට හේතු වේ” මේ යටතේ විවාදයක් සංවිධානය කිරීම. | ශ්‍රී ලංකාවට ආවේණික ඖෂධ ශාක හා සතුන් ලැයිස්තුවක් සකස් කිරීම. වඳවීමේ තර්ජනයට ලක් වී ඇති ශාක හා සතුන් එයට ලක්වීමට හේතු පෙළගස්වන්න. | දේශණ<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>කේෂ්ත්‍ර චාරිකා<br>බුද්ධි කලම්භනය<br>සම්මුඛ සාකච්ඡා<br>ප්‍රශ්නකරණය | වීඩියෝ දර්ශන<br>පුවත්පත්<br>තාක්ෂණික මෙවලම්<br>පෝස්ටර් / චිත්‍ර | ඔබ ප්‍රදේශයේ ඇති ජෛව විවිධත්වයෙන් යුත් වනාන්තරයක් නැරඹීමට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 9.3.1 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික අංග ලක්ෂණ | ඔබ නිවසේ සහ පාසලේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පෙළගස්වන්න. | ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම ඇති රටවල් පහක් නම්කර ඒවා ලෝක සිතියමක ලකුණු කරන්න. | දේශණ<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>කේෂ්ත්‍ර චාරිකා<br>බුද්ධි කලම්භනය<br>සම්මුඛ සාකච්ඡා<br>ප්‍රශ්නකරණය | වීඩියෝ දර්ශන<br>පුවත්පත්<br>තාක්ෂණික මෙවලම්<br>පෝස්ටර් / චිත්‍ර | පාර්ලිමේන්තුවේ විවාදයක් නැරඹීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. | |
| 9.3.2 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම් හා යුතුකම් | ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම් ලැයිස්තුවක් පිළියෙල කරන්න. | වත්මන් සමාජයකට යුතුකම් ඉටුකිරීමේ වැදගත්කම පැහැදිලි කරමින් පොහෝ දින විද්වත් කථිකාවක් සංවිධානය කිරීම. | දේශණ<br>සංවාද<br>සිද්ධි අධ්‍යයනය<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>කේෂ්ත්‍ර චාරිකා<br>බුද්ධි කලම්භනය<br>සම්මුඛ සාකච්ඡා<br>ප්‍රශ්නකරණය | වීඩියෝ දර්ශන<br>පුවත්පත්<br>තාක්ෂණික මෙවලම්<br>පෝස්ටර් / චිත්‍ර | තම අයිතිවාසිකම් බුක්ති විඳින අතර අන් අයගේ අයිතිවාසිකම් වලට ද ගරුකළ යුතුය. මෙම අදහස හුවා දක්වන භූමිකා රංගනයක් රඟ දැක්වීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 9.3.3 දේශපාලන පක්ෂ | දේශපාලන පක්ෂයක් යනු කුමක්දැයි හඳුන්වා නිදහසින් පසු මේ දක්වා පිහිටුවාගෙන ඇති ප්‍රධාන දේශපාලන පක්ෂ නම් කරන්න. | ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක කරගැනීම සඳහා දේශපාලන පක්ෂ මඟින් ඉටුකරනු ලබන කාර්‍යභාරය පිළිබඳව පුවත්පතකට ලිපියක් සැකසීම. | දේශන<br>සංවාද<br>බුද්ධිකලම්භනය<br>සිද්ධි අධ්‍යනය | පුවත්පත්<br>හැන්සාඩ් වාර්තා<br>පැරණි ගුවන්<br>විදුලි හඬපට | වර්තමාන දේශපාලන ක්‍රමය තුල වාර්ගික දේශපාලන පක්ෂ වැඩි වශයෙන් බිහිවෙමින් පවතී. ඒවාට බලපා ඇති හේතු පෙළගස්වන්න. | |
| 9.3.4 මැතිවරණ හා ඡන්ද බලය | සර්ව ජන ඡන්ද බලය ලබාදීමෙන් අත්වී ඇති ප්‍රයෝජන විස්තර කරමින් උදෑසන රැස්වීමේදී සාරවත් කතාවක් ඉදිරිපත් කරන්න. | ඔබ පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන් තෝරා ගැනීම සඳහා මැතිවරණයක් සංවිධානය කරන්න. | දේශන<br>සංවාද<br>බුද්ධිකලම්භනය<br>සිද්ධි අධ්‍යනය | පුවත්පත්<br>හැන්සාඩ් වාර්තා<br>පැරණි ගුවන්<br>විදුලි හඬපට | ඔබ පාසලේ ශිෂ්‍ය පාර්ලිමේන්තුව මඟින් අවට පාසලක ශිෂ්‍ය පාර්ලිමේන්තුව සමග කැබිනට් මණ්ඩල විවාදයක් සංවිධානය කිරීම. | |
| 9.3.5 ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු ලෙස අවස්ථානෝචිතව ස්ථිර භාවයෙන් කටයුතු කිරීම | “ස්ථිරසාර භාවය” ගොඩ නගා ගැනීම සඳහා පුද්ගලයෙකු තුළ ගොඩනගා ගතයුතු ගුණාංග පෙළගස්වන්න. | අන්අය සමග සුහවාදී ආකල්ප වලින් යුතුව කටයුතු කරන්නේ කෙසේදැයි බිත්ති පුවත්පතකට ලිපියක් පිළියෙල කරන්න. | දේශන<br>සංවාද<br>බුද්ධිකලම්භනය<br>සිද්ධි අධ්‍යනය | පුවත්පත්<br>හැන්සාඩ් වාර්තා<br>පැරණි ගුවන්<br>විදුලි හඬපට | පුද්ගල තුළ ස්ථිරසාර භාවය ගොඩනගා ගැනීමට වර්ධනය කළයුතු ගුණාංග කවරේදැයි පැහැදලි කරමින් පුවත්පතකට ලිපියක් ලියන්න. | |

| අනු ඒකකය | | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|
| 9.3.6 | ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු ලෙස ජාතිය ගොඩනැගීම සඳහා කැපවීම. | ජාතික ප්‍රතිපත්ති වලට අනුගතව කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරමින් සඟරාවකට ලිපියක් සකස් කරන්න. | ශ්‍රී ලාංකික පුරවැසියකු වශයෙන් ජාතික සාමය හා සමගිය ගොඩනැගීම සඳහා කැපවීමෙන් කටයුතු කළයුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව නිදහස් දින උත්සවයට කතාවක් සකස් කිරීම. | දේශන<br>සංවාද<br>බුද්ධිකලම්භනය<br>සිද්ධි අධ්‍යනය | පුවත්පත්<br>හැන්සාඩ් වාර්තා<br>පැරණි ගුවන්<br>විදුලි හඬපට | වාර්ගික හෝ ආගමික උත්සවයක් පැවැත්වෙන අවස්ථාවකදී ඔබ පාසලට සමීප සිංහල දෙමළ හෝ මුස්ලිම් පාසලකට ආරාධනා කිරීමට ආරානා පත්‍රයක් පිළියෙල කරන්න. | |
| 9.4.1 | පළාත් පාලන ආයතන වල ව්‍යුහය | ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වල ව්‍යුහය දක්වෙන ගැලීම් සටහනක් පිළියෙල කිරීම. | පළාත් පාලන ආයතන වලින් සිදුවන සේවය විස්තර කරමින් උදය රැස්වීමේදී සාරවත් කතාවක් පැවැත්වීම. | කණ්ඩායම්<br>ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>ගවේෂණ<br>සම්මුඛ සාකච්ඡා | පුවත්පත්<br>සඟරා<br>වීඩියෝ දර්ශන | ඔබ දිස්ත්‍රික්කයේ ඇති පළාත් පලන ආයතන නම් කරන්න. | |
| 9.4.2 | පළාත් පාලන ආයතන වලින් සිදුවන සේවය | පළාත් පාලන ආයතන වලින් සිදුවන සේවාවන් පෙළගස්වන්න. | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් සිදුවන සේවය අගය කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කිරීම. | කණ්ඩායම්<br>ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>ගවේෂණ<br>සම්මුඛ සාකච්ඡා | පුවත්පත්<br>සඟරා<br>වීඩියෝ දර්ශන | ඔබ ප්‍රදේශයේ ඇති පළාත් පාලන ආයතනයක කටයුතු නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන්න. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 9.4.3 පළාත් පාලන ආයතන වල සේවා හා සම්බන්ධ මහජන යුතුකම් | ඔබ විසින් පළාත් පාලන ආයතන හා සම්බන්ධයෙන් ඉටුකළ යුතු යුතුකම් පෙළගස්වන්න. | මහජන යුතුකම් පැහැර හරින විටක ගතහැකි නීතිමය ක්‍රියාමාර්ග පෙළගස්වන්න | කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>ගවේෂණ<br>සම්මුඛ සාකච්ඡා | පුවත්පත්<br>සඟරා<br>වීඩියෝ දර්ශන | පළාත් පාලන ආයතනවලට නියෝජිතයින් තෝරාපත්කර ගැනීමේදී ඔබ විසින් සැලකිලිමත් වියයුතු කරුනු පෙළගස්වන්න. | |
| 9.4.4 පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂමව ඉටුකිරීමේ වැදගත්කම | මහජන නියෝජිතයන්ගෙන් සහ නිලධාරීන්ගෙන් පළාත් පාලන ආයතනයක සේවා කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ලැයිස්තු ගත කරන්න. | පළාත් පාලන ආයතනයක කාර්‍යක්ෂමතාවය වැඩිකිරීම සඳහා මහජනතාවට දායක විය හැකි ආකාරය විස්තර කරන්න. | කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>ගවේෂණ<br>සම්මුඛ සාකච්ඡා | පුවත්පත්<br>සඟරා<br>වීඩියෝ දර්ශන | ඔබ ප්‍රදේශයේ දක්ෂ හා කාර්යක්ෂම මහජන නියෝජිතයකු තෝරා ඔහුව ඇගයීම සඳහා උත්සවයක් සංවිධානය කිරීම. | |
| 9.4.5 පළාත් පාලන ආයතන මඟින් ජාතික සංවර්ධනයට ලබාදෙන දායකත්වය | ඔබ ප්‍රදේශයේ මූලික වන ප්‍රාදේශීය අවශ්‍යතා හඳුනාගෙන පෙළගස්වන්න. | එම අවශ්‍යතාවලින් මූලික අවශ්‍යතා සපුරාදෙන ලෙස ඉල්ලමින් පළාත් පාලන කටයුතු භාර ඇමතිවරයාට ලිපියක් සකසන්න. | කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>ගවේෂණ<br>සම්මුඛ සාකච්ඡා | පුවත්පත්<br>සඟරා<br>වීඩියෝ දර්ශන | පළාත් පාලන ආයතන අරපිරිමැස්මෙන් කටයුතු කළ යුත්තේ කෙසේදැයි විස්තර කරමින් පුවත්පතකට ලිපියක් ලියන්න. | |
| 9.5.1 ගැටුම් පිළිබඳ විශ්ලේෂණය කරයි. | ගැටුම් යනු කුමක්දැයි නිර්වචනය කර ගැටුම්වලට හේතු පෙළගස්වන්න. | විවිධ ගැටුම් වර්ග නම්කර විස්තර කරන්න. | අධිකරණ වාර්තා<br>පොලිස් වාර්තා<br>පුවත්පත්<br>වීඩියෝ පට<br>රූපවාහිනී දර්ශන | විවාද<br>සිද්ධි අධ්‍යයනය<br>සාකච්ඡා<br>නිරීක්ෂණ<br>දේශන හා සාකච්ඡා | වර්ථමාන සමාජයේ ගැටුම් වර්ධනය වීමට බලපා ඇති හේතු පෙළගස්වන්න. | |

| අනු ඒකකය | | ඒකකයට අදාළ පැවරුම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|---|
| 9.5.2 | ගැටුම් නිරාකරණය | ගැටුම් නිරාකරණයේදී මතුවිය හැකි බාධක මොනවාදැයි පැහැදිලි කරන්න. | මැදිහත්කරුවෙකු තුළ තිබිය යුතු ගුණාංග මොනවාදැයි ලියා දක්වන්න. | අධිකරණ වාර්තා<br>පොලිස් වාර්තා<br>පුවත්පත්<br>වීඩියෝ පට<br>රූපවාහිනී දර්ශන | විවාද<br>සිද්ධි අධ්‍යයනය<br>සාකච්ඡා<br>නිරීක්ෂණ<br>දේශන හා සාකච්ඡා | සමාජය තුළ ගැටුම් අවම කිරීම සඳහා ආගම් තුළින් සිදුවන සේවාව විස්තර කරමින් රූපවාහිනී සංවාදයක් ගොඩනගන්න. | |
| 9.5.3 | ගැටුම් සුහවාදීව නිරාකරණය කිරීම | ගැටුම් සුහවාදීව නිරාකරණය කිරීමේ වාසි පෙළගස්වන්න. | ඔබ පන්ති කාරමයේ සිදුවන ගැටුමක් නිරාකරණය කරගන්නා අයුරු දැක්වෙන භූමිකා රංගනයක් නිර්මාණය කරන්න. | අධිකරණ වාර්තා<br>පොලිස් වාර්තා<br>පුවත්පත්<br>වීඩියෝ පට<br>රූපවාහිනී දර්ශන | විවාද<br>සිද්ධි අධ්‍යයනය<br>සාකච්ඡා<br>නිරීක්ෂණ<br>දේශන හා සාකච්ඡා | බහුවිධ සමාජයක් තුළ ගැටුම් අවම කරගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පෙළගස්වන්න. | |
| 9.6.1 | පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම. | පෞද්ගලික ගොනුවක ඇතුළත් වියයුතු වැදගත් තොරතුරු මොනවාදැයි ගොනු කරන්න. | විස්තරසහිතව ඔබගේ පෞද්ගලික ලිපි ගොනුවක් සකස් කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | පෞද්ගලික ලිපිගොනුවක පවතින අඩුපාඩු සම්පූර්ණ කරගැනීම සඳහා ඔබ විසින් කළයුතු කාර්‍යභාරය පැහැදිලි කරමින් ලිපියක් සැකසීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 9.6.2 විවිධ වෘත්තීන් / රැකියා | සමාජයේ ඇති විවිධ වෘත්තීන් හා රැකියා ක්ෂේත්‍ර පෙළගස්වන්න. | සෑම වෘත්තිකයෙකුම තම සේවය ගරුත්වය රැකෙන අයුරින් කටයුතු කළයුත්තේ කෙසේද යන්න පැහැදිලි කරමින් රූපවාහිනී වැඩසටහනකට ලිපියක් සැකසීම. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | ඔබ අපේක්ෂා කරන වෘත්තිය හෝ රැකියාව ලබාගැනීම සඳහා ඔබ විසින් ප්‍රගුණ කළයුතු දෑ මොනවාදැයි පෙළගස්වන්න. | |
| 9.6.3 විවිධ රැකියා / වෘත්තීන් සඳහා පිවිසුම් ගවේෂණය කරයි. | පාසලේ විෂය ධාරා තෝරා ගැනීමේදී ඔබ විසින් සැලකිලිමත් විය යුතු කරුණු පෙළගස්වන්න. | වෘත්තීය පාඨමාලා පවත්වාගෙන යනු ලබන ආයතන මොනවාදැයි පෙළගස්වන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | වෘත්තීය පුහුණු ආයතන නැරඹීමට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන්න. | |
| 9.6.4 රැකියා/ වෘත්ති සඳහා අවශ්‍ය සුදුසුකම් හා පලපුරුද්ද | වෘත්තීය පිවිසුම් සඳහා විෂයන්/ විෂයධාරාව නිවැරදිව තෝරා ගැනීමේ වැදගත්කම පෙන්වා දෙමින් උදෑසන රැස්වීම සඳහා කතාවක් සූදානම් කරන්න. | ඔබ විසින් නම් කරන ලද රැකියාවක් සඳහා කෙටිකාලීනව හා දිගුකාලීනව සපුරා ගතයුතු ශාස්ත්‍රීය හා වෙනත් අවශ්‍යතා මොනවාදැයි පෙළගස්වන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | ආදර්ශමත්ව රැකියාවක / වෘත්තියක නියැලෙන්නෙකු ඔබ පාසලේ විශේෂ අමුත්තෙකු ලෙස කැඳවා දේශනයක් පැවැත්වීම. | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 9.6.5 ඉතා උසස් ලෙස සැකසූ ජීව දත්ත පත්‍රිකාවක් තබා ගැනීම | ජීව දත්ත පත්‍රිකාවකට ඇතුළත් වියයුතු වැදගත් කරුණු මොනවාදැයි පෙළගස්වන්න. | ඔබේ පෞද්ගලික තොරතුරු ඇතුළත් ජීව දත්ත පත්‍රිකාවක් පිළියෙල කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | රැකියාවක සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඔබ විසින් රැගෙන යා යුතු දෑ මොනවාදැයි ලැයිස්තුවක් සකසන්න. | |
| 9.6.6 රැකියා ඉල්ලුම්පත්‍රයක් නිවැරදිව සම්පූර්ණ කිරීම | ගැසට් පත්‍රයකින් ලබාගන්නා ලද රැකියා ඉල්ලුම් පත්‍රයක් කල්පිත තොරතුරු ඇතුළත් කරමින් සම්පූර්ණ කරන්න. | අයදුම්පතක් යොමු කරන ලියුම් කවරයක මුල් පිටුව සම්පූර්ණ කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | තැපැල් කාර්යාලයක ලිපි හා සම්බන්ධ කටයුතු දැක බලා ගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. | |
| 9.6.7 රැකියා ඇබෑර්තුවක් සඳහා ලිපියක් සැකසීම | රැකියාවක් සඳහා අවශ්‍ය වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පෙළගස්වන්න. | ඉල්ලුම්පතක් පිරවීමට පෙර ලිපියේ කටුසටහන පිරවීමේ ඇති වැදගත්කම විස්තර කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | රැකියාවක් සඳහා අයදුම් කිරීමේදී ඔබ විසින් සැලකිලිමත් වියයුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න. | |
| 9.6.8 සම්මුඛ පරීක්‍ෂණ | කිසියම් වෘත්තියක් සඳහා සම්මුඛ පරීක්‍ෂණයට මුහුණ දෙන අයුරු භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කරන්න. | සම්මුඛ පරීක්ෂණයකදී ඔබ විසින් සිදුකරන අත්වැරදි මොනවාදැයි ලියා දක්වන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | සම්මුඛ පරීක්ෂණයකින් ඔබ අසමත් වුවහොත් ඔබගේ අඩුපාඩු මගහරවා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග පෙළගස්වන්න | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 9.6.9 සම්මුඛ පරීක්‍ෂණයකට හොඳින් මුහුණදීමේ වැදගත්කම | සම්මුඛ පරීක්ෂණයට මුහුණදීම සඳහා ඔබ විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග මොනවාද ? | සම්මුඛ පරීක්‍ෂණයකට මුහුණ දෙන අයුරු දක්වෙන චිත්‍රයක් නිර්මාණය කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | සම්මුඛ පරීක්ෂණයකදී ඔබ විසින් නොකළයුතු දෑ මොනවාදැයි පැහැදිලි කරන්න. | |
| 9.6.10 කාල කළමනාකරණය කරගැනීම | කාලය කළමනාකරණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරමින් කතාවක් ඉදිරිපත් කරන්න. | අධ්‍යාපන කටයුතු වලදී කාලය කළමනාකරණය නොකිරීමෙන් ඇතිවන ගැටළු පෙළගස්වන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | විවිධ ආයතනවල කාලය අරපිරිමැස්මෙන් භාවිතා නොකිරීමෙන් ඇති වී ඇති ගැටළු පෙළගස්වන්න. | |
| 9.6.11 සැමවිටම හොඳින් හැසිරීමේ වැදගත්කම | තම හැසිරීමෙන් අන් අයට වන යහපත් හෝ අයහපත් ප්‍රතිඵල මොනවාදැයි මතුකර ගන්න. | සේවා ස්ථානයේදී ඔබේ හැසිරීම අන් අයට කරදරයක් වූ විට ආයතනයට සිදුවන ප්‍රතිවිපාක මොනවාද ? | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | සේවා ආයතනයේ සියලු දෙනා විසින් ප්‍රගුණ කරගත යුතු ගුණාංග මොනවාදැයි පෙළගස්වන්න. | |
| 9.6.12 නිවැරදිව පෞද්ගලික මූල්‍ය කළමනාකරණය | තම ආදායමට අනුව වියදම සකස් කිරීමෙන් දෛනික කටයුතු පහසුවන ආකාරය විස්තර කරන්න. | ණයපත් වල වාසි හා අවාසි පෙළගස්වන්න. | සාකච්ඡා ක්‍රමය<br>සංවාද<br>කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර චාරිකා<br>භූමිකා රංගන | පුවත්පත්<br>වීඩියෝපට | ණය වීමේ හා ණයපත් භාවිතයේ අවදානම විස්තර කරන්න. | |
| 9.6.13 වෘත්තිය හා පෞද්ගලික ජීවිතය සමතුලිත ලෙස පවත්වාගැනීම. | පවුලේ සාමාජිකයන් සමග ඔබ විවේකය ගත කිරීමේ වැදගත්කම අගය කරමින් උදෑසන රැස්වීමේදී කතාවක් ඉදිරිපත් කරන්න. | විවේක කාලය ඵලදායීව ගතකිරීම සඳහා ඔබට ගතහැකි ක්‍රියාකාරකම් පෙළගස්වන්න. | | | වෘත්තී ජීවිතය හා සමාජීය ජීවිතය සමතුලිතව පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරමින් පුවත්පතකට ලිපියක් සකසන්න. | |